**පාවිච්චි කර මෙරටට ආනයනය කරන ලද (Reconditioned Vehicle) වාහන සඳහා ආදායම් බලපත්‍ර නිකුත් කිරීම.**

පාවිච්චි කර මෙරටට ආනයනය කරනු ලබන (Reconditioned Vehicle) වාහන සඳහා පළමු වසරේ සිටම ආදායම් බලපත්‍රය ලබා ගැනීමේදී වායු විමෝචන සහතිකය ලබා ගැනීම අවශ්‍ය බව කාරුණිකව දන්වමි.

**වාර්ෂික ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේදී වායු විමෝචන සහතිකය ලබා ගැනීමෙන් කෘෂිකාර්මික ඉඩම් වාහන නිදහස් කිරීම.**

සියළුම කෘෂිකාර්මික ඉඩම් වාහන සඳහා ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේදී ඒ සඳහා වායු විමෝචන සහතිකය ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත. කෘෂිකාර්මික ඉඩම් වාහන ලෙස සලකනු ලබන්නේ රෝද හතරේ කෘෂි කාර්මික ට්‍රැක්ටර් හා අත් ට්‍රැක්ටර් පමණක් බව දන්වා සිටිමි.

**ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් (Liquid Petroleum Gas) ධාවනය වන වාහන සඳහා ආදායම් බලපත්‍ර නිකුත් කිරීම.**

2009 අංක 08 දරන මෝටර් වාහන සංශෝධන පනතේ විධිවිධාන අනුව ද්‍රව පෙට්‍රෝලියම් වායුව (Liquid Petroleum Gas) භාවිතා කරමින් ධාවනය කරනු ලබන වාහන, මෝටර් වාහනයක් ලෙස අර්ථකථනය කර ඇති හෙයින් එම වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී වායු විමෝචන සහතිකය ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.

**ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් (Liquid Petroleum Gas) ධාවනය වන වාහන සඳහා ගාස්තු.**

2009 අංක 08 දරන මෝටර් වාහන සංශෝධන පනතේ විධිවිධාන අනුව ද්‍රව පෙට්‍රෝලියම් වායුව (Liquid Petroleum Gas) භාවිතා කරමින් ධාවනය කරනු ලබන වාහන, මෝටර් වාහනයක් ලෙස අර්ථකථනය කර ඇති හෙයින් එම වාහන සඳහා බලපත්‍ර ලබා දීමේදී පෙට්‍රල් වාහන වලට අය කරනු ලබන ගාස්තු අය කර ආදායම් බලපත්‍රය නිකුත් කරන ලෙස දන්වමි.

**විදුලිබලයෙන් ධාවනය වන (Electrical Vehicle) හා විදුලිබලය සමග පෙට්‍රල් හෝ ඩීසල් වලින් ධාවනය වන (Hybrid Vehicle) වාහන සඳහා ආදායම් බලපත්‍රය නිකුත් කිරීම.**

විදුලිබලයෙන් ධාවනය වන (Electrical Vehicle) හා විදුලිබලය සමග පෙට්‍රල් හෝ ඩීසල් වලින් ධාවනය වන (Hybrid Vehicle) වාහන සඳහා ආදායම් බලපත්‍රය නිකුත් කිරීමේදී වායු විමෝචන සහතිකය ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.

**දුම් පරීක්ෂණ සහතිකය සංශෝධනය කිරීම.**

ලාෆ් එකෝ ශ්‍රී සමාගම සහ ක්ලීන්කෝ ලංකා සමාගම විසින් නිකුත් කරනු ලබන නව වායු විමෝචන පරීක්ෂණ සහතික වල ආදර්ශයක් මින් පෙර ඔබ වෙත එවා ඇති අතර එම සහතිකයේ කාර්යාල ප්‍රයෝජනයට වෙන් කර ඇති පහළ කොටස විගණන හා විමර්ශණ කටයුතු සඳහා ගොනු කර තබා ගන්නා ලෙස දන්වමි. එසේම එක් වායු විමෝචන සහතිකයකින් ලබා ගත හැකි වන්නේ එක් ආදායම් බලපත්‍රයක් පමණි.

**අළුත්වැඩියා කරන ලද වාහන.**

වාහනයක එන්ජිම අළුත්වැඩියා කර ඇති බවට වාහන හිමිකරු තහවුරු කරන්නේ නම් එන්ජිම අළුත්වැඩියා කර ඇති දින සිට වාහනයේ දුර මාපකයේ සටහන් වන කිලෝමීටර ප්‍රමාණයේ සිට ඉදිරියට කිලෝමීටර 2000 ක් හෝ එන්ජිම අළුත්වැඩියා කර ඇති දින සිට ඉදිරියට මාස 02ක් හෝ ඉන් පළමුව සම්පූර්ණ වන

තත්වයන් මත වාහනය ධාවනය කළ හැකි වන පරිදි වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව අයකර ගෙන කුවිතාන්සියක් නිකුත් කිරීමට කටයුතු කරන්න. එම තත්වය සම්පූර්ණ වීමෙන් පසු වාහන හිමිකරු විසින් වාහන වායු විමෝචන සහතිකය ඉදිරිපත් කර වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගත යුතුයි. වාර්ෂික ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේදී වායු විමෝචන සහතිකයේ අංකය වාර්ෂික ආදායම් බලපත්‍රයේ දකුණු පස උඩ කෙළවරේ සටහන් කිරීමට කටයුතු කරන්න. මෙම කරුණ සම්බන්ධයෙන් යම් වාහන හිමිකරුවෙක් ඉහත දැක්වෙන පරිදි ක්‍රියා කිරීමට අපොහොසත් වුව හොත් එය සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා මා වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලෙස දන්වන මෙන් වැඩි දුරටත් ඉල්ලා සිටිමි.

වාහන වායු විමෝචන අධීක්ෂණ කටයුතු මෙම දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය වායු සම්පත් කළමණාකරණ කේන්ද්‍රය සහ මිනුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටුකරන අතර ඊට අමතරව එම මධ්‍යස්ථාන අධීක්ෂණ කටයුතු සඳහා ඔබ වෙතද බලය පවරමි. ඔබට මෙම වැඩසටහන පිළිබඳ යම් ගැටළුවක් වේ නම් 011-3100152 හෝ 0112-692275 දුරකථනයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන වැඩසටහන් කාර්යාලයෙන් හෝ කාර්මික අංශයෙන් විමසන මෙන් කාරුණිකව දන්වමි. ජාතික වශයෙන් වැදගත් වන මෙම වායු විමෝචන වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ගාස්තු ඇතුලත් ලේඛණය ඇමුණුම 01 ලෙසද, මහජනතාව දැනුවත් කළ යුතු කරුණු ඇමුණුම 02 ලෙසද අමුණා ඇත.

බී.ඩී.එල්.ධර්මප්‍රිය,
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්.

පිටපත්:- 01. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

02. අධ්‍යක්ෂ, පරිසර අමාත්‍යාංශය

03. සියළුම මෝටර් රථ පරීක්ෂකවරුන්

ඇමුණුම 01

නව වාහන වායු විමෝචන පරීක්ෂණ ගාස්තු පහත දැක්වේ.

| වාහන පන්තිය | ගාස්තුව (වැට් සහිතව) |
|---|---|
| මෝටර් සයිකල් (පෙට්‍රල්) | 355.00 |
| මෝටර් සයිකල් (ඩීසල්) | 355.00 |
| ත්‍රිරෝද රථ (පෙට්‍රල්) | 435.00 |
| ත්‍රිරෝද රථ (ඩීසල්) | 435.00 |
| මෝටර් කාර් (පෙට්‍රල්) | 950.00 |
| මෝටර් කාර් (ඩීසල්) | 950.00 |
| ද්විත්ව කාර්ය වාහන/වෑන් (පෙට්‍රල්) | 1,030.00 |
| ද්විත්ව කාර්ය වාහන/වෑන් (ඩීසල්) | 1,030.00 |
| මෝටර් ලොරි (පෙට්‍රල්) | 1,350.00 |
| මෝටර් ලොරි (ඩීසල්) | 1,350.00 |
| මෝටර් කොච් (පෙට්‍රල්) | 870.00 |
| මෝටර් කොච් (ඩීසල්) | 870.00 |
| බස් (පෙට්‍රල්) | 870.00 |
| බස් (ඩීසල්) | 870.00 |
| ප්‍රයිම් මූවර් (ඩීසල්) | 1430.00 |

**ඇමුණුම 02**

**වාහන වායු විමෝචන පරීක්ෂණ සහතිකය ලබා ගැනීමට යැමේදී සැලකිලිමත් විය යුතු කරුණු.**

1. වාහනයේ ලියාපදිංචි සහතිකය රැගෙන යා යුතුයි.
2. එන්ජින් අංකය හා චැසි අංකය පහසුවෙන් කියවිය හැකි පරිදි පිරිසිදු කොට තිබිය යුතුයි.
3. පරීක්ෂණයට ඉදිරිපත් කරන අවස්ථාවේ වාහනයේ එන්ජිම ක්‍රියාකාරී උෂ්ණත්වයේ තිබිය යුතු බැවින් අවම වශයෙන් විනාඩි 10ක පමණ කාලයක්වත් එන්ජිම පණගන්වා තිබිය යුතුයි.
4. තෙල් හෝ පිටාර වායුව කාන්දු වන වාහන පරීක්ෂණයට භාජනය කරනු නොලැබේ.
5. වාහනයේ වතුර කාන්දු නොවන ලෙස හා එන්ජිම මනා ක්‍රියාකාරිත්වයකින් තිබිය යුතුය. එසේ නොමැතිව පරීක්ෂණය සඳහා භාජනය කරන වාහනයකට පරීක්ෂණ ක්‍රියාවලිය තුළදී යම් අලාභයක් සිදුවේ නම් එය වාහන අයිතිකරු විසින් දැරිය යුතුය.